**සැලසිනේ රූපවාහිනී ආයතනය - 2018**

---

## 1.1 තත්ත්වාගණනය කළ මතය

සැලසිනේ රූපවාහිනී ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

------------------

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

----------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.19,185,720 ක් වූ දේපළ, පිරියත හා උපකරණ සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණි. ඉන් තවදුරටත් භාවිතයට ගනු ලබන වත්කම් හඳුනාගෙන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 හි 65 වන ජේදය ප්‍රකාරව, ඵලදායී ජීවන කාලය වාර්ෂිකව සමාලෝචනය කර ඇස්මේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමටත්, භාවිතා කළ නොහැකි වත්කම් සුදුසු පරිදි අපහරණය කර මූල්‍ය ප්‍රකාශන නිවැරදි කිරීමටත් කටයුතු කර නොතිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත අංක 03 පරිදි ඵලදායී ජීවිත කාලය සමාලෝචනය කර නැවත තක්සේරු කිරීමට කටයුතු යොදා ඇති අතර, භාවිතා කළ නොහැකි වත්කම් අපහරණය කිරීමටත් ඉන්වෙන්ට්‍රි ලේඛණයෙන් කපා හැරීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ. | ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන නිවැරදි කිරීම සඳහා කටයුතු කළ යුතු බව. |
| (ආ) ආයතනයේ නිලධාරිනියක විසින් ආයතනයට විරුද්ධව පැවරු නඩුවක තීන්දුව මත අදාල නිලධාරිනියට රු.992,080 ක් 2019 ජුලි 03 දින ගෙවා තිබුණ ද, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 06 හි 9 ජේදය ප්‍රකාරව මෙය මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම්කර නොතිබුණි. | 2018 වර්ෂයේ ගිණුම් වාර්තාවේ එය අතපසු වීමකින් ඇතුළත් කිරීමට නොහැකි විය. ප්‍රතිපාදන සැලසීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | ශේෂපත්‍ර දිනට පසු සිදුවීම්වල ස්වභාවය අනුව සුදුසු පරිදි මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට සහ හෙළිදරව් කිරීම් කළ යුතු වීම. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පාරිතෝෂික වෙන්කිරීම් රු.11,119,014 ක් විය යුතු වුවත්, රු.11,919,393 ක් ලෙස දැක්වීම හේතුවෙන් පාරිතෝෂික වෙන්කිරීම් රු.800,379 කින් වැඩිපුර දක්වා තිබුණි. | පාරිතෝෂික අධි වෙන් කිරීම රු.800,379/- ක මුදල ඉදිරියට ගෙන ආ ලාභඅලාභ ගිණුමට ගළපා නිවැරදි කරනු ලැබේ. | පාරිතෝෂික වෙන්කිරීම් නිවැරදිව ගණනය කර ගිණුම් ගත කළ යුතු වීම. |

**1.5.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විෂයය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| දේපළ, පිරියත හා උපකරණ | 8,602,172 | විස්තරාත්මක උපලේඛන | වත්කම් සම්බන්ධයෙන් ඒවායේ ජීවිත කාලය, තක්සේරු අගය, සමුච්චිත ක්ෂය දැක්වෙන අංග සම්පූර්ණ ලේඛනයක් සකස් කරමින් පවතී. | දේපළ, පිරියත හා උපකරණ සඳහා විස්තරාත්මක උපලේඛන පවත්වා ගත යුතු වීම. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වෙළෙඳ ණයගැති ශේෂය රු451,976,993 ක් වු අතර ඒ තුළ වර්ෂ 3 ඉක්මවු ණයගැති ශේෂය රු.102,655,375 ක් එනම් මුළු ණයගැති ශේෂයෙන් සියයට 23 ක් විය. මෙම ශේෂ අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග අනුගමනය කර නොතිබුණු අතර 2019 ජුලි 31 දින වනවිට එයින් රු.100,024,268 ක් තවදුරටත් අයවීමට පැවතුණි. | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වෙළෙඳ ණයගැති ශේෂය රු.451,976,993 ක් වු අතර, එහි ඇතුළත් වර්ෂ 03 ඉක්මවු ණයගැති ශේෂය වන රු.102,655,375 ක් අයකර ගැනීමට කටයුතු යොදා ඇත. | ණය අයකර ගැනීමේ කටයුතු කඩිනම් කළ යුතු වීම. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂය රු.51,372,048 ක් වූ අතර එයින් 2015, 2016 හා 2017 වර්ෂයන්හි සිට පැවත එන රු.36,422,506 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2015, 2016 හා 2017 වර්ෂවලට අදාලව කළ යුතු ගෙවීම් ඒවාට සම්බන්ධ සේවාදායකයන් වෙතින් ලබාගෙන නිරවුල් කිරිමට කටයුතු කර ඇත. | ගෙවිය යුතු ගිණුම් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. |

### 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 105 හා 109 | 2017 ඔක්තෝබර් අස්තානගතවී තිබුණු රු.94,900 ක පිරිවැය වූ කැමරාවක් සම්බන්ධයෙන් විමර්ශනය සඳහා පත්කළ කමිටුවේ 2017 දෙසැම්බර් 19 දින වාර්තාව අනුව රු.118,625 ක අලාභයක් අයකර ගැනීමට තීරණය කර තිබුණද, 2019 ඔක්තෝබර් 25 දිනවන විටත් එම අලාභ අයකර ගැනීමට හා ඉන්වෙන්ට්‍රිලේඛනවලින් ඉවත් කිරීමට පියවර ගෙන නොතිබුණි. | මෙම අයකර ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇති අතර, ඉදිරියේදී අදාළ පාර්ශව වෙතින් නොපමාව අයකර ගැනීමට හා ඉන්වෙන්ට්‍රියෙන් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ. | කමිටු නිර්දේශ ප්‍රකාරව අලාභ අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ii) මුදල් රෙගුලාසි 371(2) (ආ) හා 2015 ජූලි 14 දිනැති හා PFD/RED/01/04/ 2015/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | අවස්ථා 23 කදී, මාණ්ඩලික නොවන සේවකයින් 8 දෙනෙකුට අත්තිකාරම් ලෙස රු.494,662 ක් ලබාදී තිබුණු අතර අවස්ථා 13 කදී රු.100,000ක උපරිමය ඉක්මවා එකතුව රු.3,374,500 ක අත්තිකාරම් ලබා දී තිබුණි. | ආයතනයේ සංග්‍රහ කටයුතු සඳහා අවශ්‍ය දෑ මිලට ගැනීමට පමණක් මාණ්ඩලික නොවන අය වෙත අත්තිකාරම් ලබා දී තිබුණද වර්තමානයේ එය නිවැරදි කර මාණ්ඩලික මට්ටමේ නිළධාරියෙකු වෙත ලබා දේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අත්තිකාරම් ලබා දීම හා පියවීම සිදුකළ යුතුවීම |
| (iii) මුදල් රෙගුලාසි 396 | එකතුව රු.106,735 ක් වූ මාස 6 ඉක්ම වූ චෙක්පත් 9ක් සම්බන්ධයෙන් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) 2000 ජනවාරි 11 දිනැති පීඑෆ්/පීඊ/05 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය<br><br>(ඇ) 2003 ජුනි 02 දිනැති හා අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමෙන් තොරව සංග්‍රහ දීමනා, අලෙවි දීමනා සහ පැමිණීමේ දීමනා ලෙස සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.1,553,256 ක් ගෙවා තිබුණි. | මෙම දීමනා ගෙවීම් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන සිදුකර ඇත. | ගෙවීම් සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගත යුතු වීම. |
| (i) 6.5.3 වගන්තිය | 2017 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2019 ඔක්තෝබර් 25 දින වනවිටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | වාර්ෂික වාර්තාව ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර කැබිනට් අනුමැතිය ලබා ගැනීමට කටයුතු යොදා ඇත. | වාර්ෂික වාර්තාව කඩිනමින් සභාගත කළ යුතු වීම. |
| (ii) 8.2.1 වගන්තිය | එක් එක් වර්ෂයට අදාල ආදායම් අතිරික්තය භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කළ යුතු වුවත්, ආයතනය විසින් එසේ කටයුතු කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.29,704,437 ක් හා ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,210,437 ක් ද විය. | ආයතනය රජයේ භාණ්ඩාගාරයෙන් කිසිදු මුදලක් නොලබා මෙහෙයුම් කටයුතු සිදුකරනු ලබන අතර, එහි ක්‍රියාකාරකම් තුළින් උපයාගත් අතිරික්තය ඉදිරියේදී ආයතනය සඳහා ගොඩනැඟිල්ලක් ලබා ගැනීම, සෙසු වත්කම් ලබා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිතව ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීමට කටයුතු කර ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව අතිරික්ත ආදායම් ප්‍රේෂණය කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (iii) 8.2.2 වගන්තිය | මුදල් අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව එකතුව රු.මිලියන 20 ක් ස්ථාවර තැන්පතු 3ක ආයෝජනය කර තිබුණි. | ගරු ඇමතිතුමාගේ එකඟතාවය ලබා ගැනීමට රේඛීය අමාත්‍යාංශය හරහා ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති බව සඳහන් කරමි. | ආයෝජන සඳහා මුදල් අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (iv) 8.3.3 වගන්තිය | 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන දින 140 ක ප්‍රමාදයකින් පසුව ඉදිරිපත් කර තිබුණද සමාලෝචිත වර්ෂයේ ප්‍රසාද දීමනා ලෙස රු.1,293,348 ක් ගෙවා තිබුණි. | ඉදිරියේදී නියමිත දිනට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට පියවර ගනුලබන අතර ප්‍රසාද දීමනා ගෙවීම අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන සිදුකර ඇත. | උපදෙස් පරිදි ප්‍රසාද දීමනා නොගෙවිය යුතු වීම. |
| (ඇ) 2015 මැයි 25 දිනැති පීඊඩී 2/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව සන්නිවේදන බිල්පත් සඳහා ගෙවීම් කළ හැකි වුවද, ආයතනය විසින් ස්ථාවර දීමනාවක් වැටුපට එකතුකර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.1,492,200 ක් ගෙවා තිබුණි. තවද, නිලධාරීන් 03දෙනෙකු සඳහා චක්‍රලේඛයෙන් අනුමත දීමනාවට පටහැනිව රු.88,000 ක් වැඩිපුර ගෙවා තිබුණු අතර විධායක නොවන කාර්යමණ්ඩලය සඳහා රු.467,999 ක් ගෙවා තිබුණි. | ආයතනයේ මාණ්ඩලික මට්ටමේ නිලධාරීන් තිදෙනෙක් සිටින අතර, එම නිලධාරීන් සඳහා රු.9,000 ක මාසික හිමිකම තිබුණද ගෙවනු ලබන්නේ රු.7,000 ක් බැගිනි. සෙසු නිළධාරීන්ට චක්‍රලේඛය පරිදි රු.5,000 දක්වා වූ දුරකථන දීමනා සුදුසු පරිදි ලබාදී ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව බිල්පත් ප්‍රතිපූර්ණය කළ යුතු වීම. |
| (ඉ) 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 හා 2018 ජනවාරි 24 දිනැති අංක 05/2008(I) දරන රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ චක්‍රලේඛය | සියළුම රාජ්‍ය ආයතනවල පුරවැසි ප්‍රඥප්තිය සකස් කිරීම සිදුකළ යුත වුවද ආයතනය විසින් පුරවැසි ප්‍රඥප්තිය සකස් කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි | ඉදිරියේදී පුරවැසි ප්‍රඥාප්තිය සකස් කිරීමට කටයුතු කරනු ලැබේ. | පුරවැසි ප්‍රඥාප්තියක් සකස් කිරීමට කටයුතු කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය
------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල
----------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.29,704,437 ක ලාභයක්වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභයරු.1,210,437 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.28,494,000ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනය සඳහා ආදායම් අඩු වුවද ඊට සාපේක්ෂව සෘජු වියදම් හා විකුණුම් හා බෙදාහැරීම් වියදම් අඩු වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

ඉකුත් වර්ෂය හා සැසඳීමේදී ආදායම් රු.637,351,163 ක සිට සමාලෝචිත වර්ෂයේ ආදායම් රු.597,861,538 ක් දක්වා රු.39,489,625 කින් හෙවත් සියයට 6 කින් අඩුවී තිබුණි. එහෙත් වෙනත් ආදායම් ඉකුත් වර්ෂයේදී රු.4,379,747 ක සිට සමාලෝචිත වර්ෂයේදී රු.13,822,647 ක් දක්වා සියයට 215 කින් වැඩි වී තිබුණි. එමෙන්ම සෘජු වියදම් ඉකුත් වර්ෂයේදී රු.541,297,910 ක සිට සමාලෝචිත වර්ෂයේදී රු.490,793,242 ක් දක්වා රු.50,504,668 කින් හෙවත් සියයට 9 කින් ද විකුණුම් හා බෙදාහැරීම් වියදම් ඉකුත් වර්ෂයේදී රු.26,231,866 ක සිට සමාලෝචිත වර්ෂයේදී රු.21,892,667 ක් දක්වා රු.4,339,199 කින් හෙවත් සියයට 17 කින් ද අඩු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුද්‍රණ ආයතනයක් ස්ථාපිත කිරීමේ අරමුණින් වර්ෂයක කාලයකට ගොඩනැගිල්ලක් කුලී පදනම මත ලබා ගැනීම සඳහා රු.480,000 ක් 2016 නොවැම්බර් 15 දින බාහිර පාර්ශවයකට ගෙවා තිබුණි. එම ගොඩනැගිල්ල භාවිතයට සුදුසු තත්ත්වයට සකස්කර නොතිබියදී අදාල මුදල් ගෙවා තිබුණු අතර බඳුකරු සමඟ ගිවිසුමකට ද එළඹ නොතිබුණි. එබැවින් මුද්‍රණ අංශයක් ස්ථාපිත කිරීමේ අරමුණ ඉටුකර ගෙන නොතිබුණු අතර ඉන් රු.400,000 ක් නැවත අයකර ගැනීමට ද නොහැකි වී තිබුණි. | මීට පෙර පැවති පාලන අධිකාරිය විසින් ගොඩනැගිල්ලක් කුලී පදනම මත ලබා ගැනීම සඳහා රු.480,000/- ක් බාහිර පාර්ශවයකට ගෙවන ලදී. එහෙත් එම ගොඩනැගිල්ල නිසි පරිදි සම්පූර්ණ කර භාර දීමක් සිදු නොවිණි. පසුව පැවති පාලන අධිකාරිය මෙම ගොඩනැගිල්ල අවශ්‍ය නොවන බව තීරණය කරන ලදී. අදාල මුදලින් රු.80,000/- ක් ලබා ගැනීමට කටයුතු කරන ලදී. ඉතිරි මුදල ලබා ගැනීම සඳහා නීතිඥ මහතෙකු මඟින් නඩු පවරන බව දන්වා ලිපි යැවීමට කටයුතු කරන ලදී. | ආයතනයේ කාර්යභාරය අනුව ශක්‍යතා අධ්‍යයනයන් මත සැලසුම් සකස් කළ යුතු වීම හා වියදම් දැරීමට ප්‍රථම විධිමත් ගිවිසුම්වලට එළඹිය යුතු වීම. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මෙම ආයතනය 2001 දෙසැම්බර් 20 දින මහවැලි අධිකාරියෙන් ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත පවරා ගෙන තිබුණත්, එහි අරමුණු හා කාර්යයන් නිශ්චය කර බලතල ක්‍රියාත්මක කිරීමට පනතකින් හෝ වෙනත් නීතියකින් විධිවිධාන සලසා නොතිබුණි. මෙම ආයතනය "සැලසිනේ ලිමිටඩ්" ලෙස සමාගම් පනත යටතේ පොදු සමාගමක් ලෙස ලියාපදිංචි කිරීමට 2009 වර්ෂයේ සිට කටයුතු කරමින් තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් එම කටයුතු අවසන් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2018 වර්ෂයේදී ආයතනය රජයට අයත් "ඇපයෙන් සීමිත සමාගමක්" ලෙස ලියාපදිංචි කිරීමට අදාළව කැබිනට් අනුමැතිය ලැබීමෙන් අනතුරුව ඒ සඳහා සාංගමික ව්‍යවස්ථාවලියක් සකස්කර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව මුදල් අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් (නීති) අංශය වෙත යවා ඇත. | ආයතනය සංස්ථාගත කිරීමේ කටයුතු කඩිනමින් අවසන් කළ යුතු වීම |

| | | |
|---|---|---|
| (ආ) 2010 අගෝස්තු 12 දිනැති අංක 10/1682/407/014 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව රාජ්‍ය ආයතනවල දැන්වීම් හා ප්‍රචාරණ කටයුතු සැලසිනේ රූපවාහිනී ආයතනය මඟින් ඉටුකළ යුතු වුවද ඒ සඳහා අවශ්‍ය මානව හා භෞතික සම්පත් අවශ්‍යතා සපුරා ගැනීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි. වර්ෂ 9 ක කාලයක් ගතවී තිබුණද, අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි කටයුතු කිරීමෙන් තොරව පෞද්ගලික ආයතනවලට උප කොන්ත්‍රාත් ලබාදීම ආයතනයේ සාමාන්‍ය ක්‍රමවේදය බවට පත්කර තිබුණි. නියැදි විගණන පරීක්ෂාව අනුව වැඩසටහන් නිෂ්පාදන කාර්යයන් 7 ක් සඳහා රු.37,418,546 ක ආදායමක් ලැබී තිබුණද, එම වැඩසටහන් නිෂ්පාදනය කිරීම වෙනුවෙන් රු.24,285,418 ක් බාහිර පාර්ශවයන්ට ගෙවා තිබුණි. | මෙම ආයතනය ආරම්භක කාල සීමාව තුළ දිගටම අලාභ ලබමින් පවත්වාගෙන ගොස් ඇති බැවින් මූලධන වත්කම් වන කැමරා උපකරණ මිලට ගැනීම් වැනි කටයුතු සිදු කළ නොහැකි වී ඇත. එනිසා බාහිර පාර්ශවයන් වෙතින් මෙම කටයුතු ඉටු කර ගැනීමට සිදු වන බව පෙන්වා දෙනු කැමැත්තෙමි. | මානව හා භෞතික සම්පත් අවශ්‍යතා සැලසුම්කර ඒවා සපුරා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ආයතනයේ සභාපතිවරයා වෙනුවෙන් කුලී පදනම මත වාහනයක් ලබා ගෙන 2017 ජූලි සිට 2018 අප්‍රේල් දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් රු.1,150,000 ක් ගෙවා තිබුණි.අංක 1/2016 හා 2016 මාර්තු 17 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 2.2 ඡේදය ප්‍රකාරව ඊට භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර චක්‍රලේඛයේ 2.3 (I) ඡේදයට පටහැනිව කි.මී. 8,864 ක් ධාවනය කර තිබුණු වාහනයක් ලබා ගෙන තිබුණි. ඊට අමතරව චක්‍රලේඛයේ 6 ඡේදය ප්‍රකාරව ආයතනය සහ බදුකරු අතර විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණු අතර සැපයුම්කරු තෝරා ගැනීමේදී විධිමත් ප්‍රසම්පාදන ක්‍රමවේද අනුගමනය කර නොතිබුණි. | ආයතනයේ සභාපතිවරයා සඳහා ලබා දිය යුතු මට්ටමේ සුදුසු වාහනයක් ආයතනය සතුව නොමැති බැවින්, කුලී පදනම මත සභාපතිවරයා සඳහා වාහනයක් ලබා දීම සිදුකරන ලදී. මේ සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාදෙන ලෙස ඉල්ලා ලිපියක් යවන ලදී. මෙම වාහනය ලබා ගැනීමේදී ප්‍රසම්පාදන කටයුතු පිළිපැදීමට කටයුතු කරන ලද අතර, අවම මිල ඉදිරිපත් කරන ලද ආයතනය වෙතින් වාහනයක් ලබා ගෙන ඇති බව සඳහන් කරමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ හා වෙනත් අදාල චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතු වීම. |
| (ආ) ආයතනය විසින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කිරීමෙන් තොරව කුලී පදනමට ගොඩනැගිල්ලක් ලබාගෙන 2016 අගෝස්තු සිට 2017 ජූනි දක්වා මාසයකට රු.120,000 ක් බැගින් රු.1,281,290 ක් කුලී හා රු.720,000 ක අත්තිකාරම් ගෙවා තිබුණු අතර මුදල් රෙගුලාසි 835 (2) (ඇ) ප්‍රකාරව මාසික කුලී වටිනාකම තීරණය කිරීම සඳහා රජයේ තක්සේරුකරුගේ සහාය ලබාගෙන නොතිබුණි. | ඉසව් කටයුතු සඳහා ප්‍රමාණවත් ඉඩකඩ වර්තමාන ගොඩනැගිල්ලෙන් ලබා ගත නොහැකි වීම නිසා ඒ සඳහා සුදුසු ගොඩනැගිල්ලක් කෙටි කාලයකට ලබා ගැනීමට කටයුතු කරන ලදී. අදාළ ගොඩනැගිල්ල තක්සේරු කිරීමට ප්‍රමාණවත් කාලයක් නොවූ අතර, ඒ වන විට | අවශ්‍යතාවයන් නිසි පරිදි අධ්‍යයනය කර විධිමත් සැලසුම් සකස්කර අවශ්‍යතාවයන් ඉටුකර ගත යුතු වීම. |

| | | |
|---|---|---|
| තවද, 2016 අගෝස්තු 11 දිනැති අංක 947 දරන ගිවිසුම අනුව එක් පාර්ශවයක් විසින් ගිවිසුම අවලංගු කරන්නේ නම් මාස 3කට පෙර ලිඛිතව අනෙක් පාර්ශවය වෙත දැන්විය යුතු වුවත්, 2017 ජුලි 01 දින සිට ගිවිසුම අවලංගු කරන බව සභාපතිවරයා විසින් ඒක පාර්ශවිකව දන්වා තිබීම හේතුවෙන් රු.640,000 ක් වූ අත්තිකාරම් ආපසු අයකරගත නොහැකි වී තිබුණි. | පැවරී තිබූ ඉසව් රාජකාරි කලට වේලාවට සිදු කිරීමට අවශ්‍ය විය. | |
| (ඇ) නෙවිල් ප්‍රනාන්දු පෞද්ගලික රෝහල රජයට පවරා ගැනීමේ උත්සවය සංවිධානය කිරීමේ කටයුතු රු.13,575,000 ක මුදලකට ආයතනය විසින් සිදුකර තිබුණු අතර එහි ප්‍රධාන සංවිධාන කටයුතු ඉටුකර ගැනීම සඳහා රු.4,544,500 ක ඇස්තමේන්තුවකට බාහිර ආයතනයක් තෝරා ගෙන තිබුණද ඒ සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ විධිවිධාන අනුගමනය කර නොතිබුණි. තෝරා ගන්නා ලද සැපයුම්කරු ඉදිරිපත් කළ ඉන්වොයිසියෙහි එකී ආයතනයේ බලයලත් නිලධාරියකු විසින් අත්සන් තබා නොතිබියදී මුදල් ගෙවා තිබුණි. තවද, එම සැපයුම්කරු සමඟ විධිමත් ගිවිසුමකටද එළඹ නොතිබුණි. මෙම උත්සවයට අදාලව හඳුනාගත් මුළු පිරිවැය රු.5,380,345 ක් වුවද සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත මිල ගණන් ඉදිරිපත් කිරීමේදී රු.13,575,000 ක් එනම් පිරිවැයට සියයට 152 ක ලාභයක් එකතු කර මිල ගණන් ඉදිරිපත් කර තිබුණි. | එම ඇස්තමේන්තු සඳහා සේවාදායක වෙතින් අනුමැතිය ලබාගත් අතර, එහිදී ආයතනයට දැරීමට සිදුවෙතැයි අපේක්ෂිත වියදම් සැලකිල්ලට ගෙන ඇස්තමේන්තු සැකසූ අතර, අවසානයේදී ඉහළ ලාභාන්තිකයක් ඒ තුළින් ලබා ගත හැකි විය. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කර විනිවිදභාවයකින් යුක්තව ප්‍රසම්පාදනයක් සිදුකළ යුතු වීම. |
| (ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 මාර්ගෝපදේශය හා අතිරේක අංක 28 ප්‍රකාරව රු.500,000 ට වැඩි සේවා ප්‍රසම්පාදනයන් සඳහා ප්‍රසම්පාදන කමිටු පත්කළ යුතු වුවත්, නියැදි විගණන පරීක්ෂාවට අනුව මුද්‍රණ කාර්යයන් 3 ක් ඉටුකර ගැනීම සඳහා බාහිර සැපයුම්කරුවන් තෝරා ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කර නොතිබුණු අතර එකතුව රු.5,041,219 ක් බාහිර පාර්ශවයන්ට ගෙවා තිබුණි. | පසුගිය කාලවකවානුවල ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියාත්මක වීම නොවූයේ ආයතනය වෙත ඉතා කෙටිකාලයක් තුළ ඉටු කිරීමට කාර්යයන් පවරන බැවිනි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කර ප්‍රසම්පාදනයන් සිදුකළ යුතු වීම. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) තෘතියික මධ්‍යම කළමනාකරණ මට්ටම යටතේ අනුමත ස්ථිර කාර්ය මණ්ඩලය 05 ක් වුවද, ආයතනය විසින් නිලධාරීන් 06 දෙනෙකු බඳවා ගෙන තිබුණි. එසේම, කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 39 දෙනෙකු පමණක් අනුමත කර තිබුණද, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව සේවකයින් 13 ක්වැඩිපුර බඳවාගෙන තිබුණි. 2015 වර්ෂයේදී ආයතනය විසින් බඳවාගැනීමේ පරිපාටියක් සකස්කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට ඉදිරිපත්කර තිබූ අතර ඊට අදාල සංශෝධන සකස් කර බඳවාගැනීමේ පරිපාටිය අනුමත කර ගැනීමට 2019 ඔක්තෝබර් වනවිටත් කටයුතුකර නොතිබුණි. | ආයතනයට කිසිදු අන්දමක මුල්‍යමය ආධාරයක් රජයෙන් නොලැබෙන අතර දැනට රජය යටතේ ඇති එකම ප්‍රචාරක ආයතනය ද මෙය වේ. එම නිසා පෞද්ගලික අංශය සමඟ තරඟකර ආයතනයට සේවා ලබා ගැනීමක් සිදු වේ. එම නිසා වැඩිපුර එක් කළමනාකරුවකු බඳවා ගෙන ඇත. දැනට ආයතනයෙහි සිදු කරනු ලබන මානව සම්පත් හා පරිපාලන විගණනයෙන් පසුව නව බඳවා ගැනීමේ පරිපාටියක් සකස් කර අනුමත කර ගැනීමට කටයුතු කරනු ලැබේ. | ආයතනයේ කාර්යභාරය අනුව සේවක මණ්ඩල අවශ්‍යතා පුරෝකථනය කළ යුතු වීම, අනුමත කාර්යමණ්ඩල සීමාව තුළ පමණක් බඳවාගැනීම් සිදුකළ යුතුවීම හා බඳවාගැනීමේ පරිපාටියේ සංශෝධනයන් සිදුකිරීමේ කටයුතු කඩිනම් කළ යුතු වීම. |
| (ආ) 2014 ඔක්තෝබර් 15 දිනැති අංක DMS/1595 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම් අමතන ලද සැලසිනේ ආයතනයේ සේවක මණ්ඩල ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා වූ ලිපිය අනුව කොන්ත්‍රාත් පදනම මත අලෙවි විධායක තනතුර සඳහා තනතුරු 6 ක් අනුමත කර තිබුණද, මාසික වැටුප තීරණය කිරීම සඳහා තනතුරට අදාල බඳවා ගැනීමේ සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ තොරතුරු අදාල දෙපාර්තමේන්තුවට ලබාදෙන ලෙස දැනුම් දී තිබුණි. එහෙත් ආයතනය විසින් අදාල තොරතුරු දෙපාර්තමේන්තුව වෙත ලබා දී වැටුප අනුමත කර ගැනීමකින් තොරව නිලධාරීන් 03දෙනෙකු සේවයේ යොදවා සමාලෝචිත වර්ෂයේදී රු.1,489,646 ක වැටුප් ගෙවා තිබුණි. | එකී ලිපියෙන් ඉල්ලා ඇති තොරතුරු එවකට සිටි පාලන අධිකාරිය විසින් ප්‍රමාද දෝෂයකින් වාර්තාකර නොමැත. | විධිමත් පරිදි අනුමැතිය ලබාගෙන වැටුප් ගෙවිය යුතු වීම. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති හා අංක පීඑඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය අනුව ගිණුම් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මාස 05 දින 05ක ප්‍රමාදයකින් පසුව 2019 අගෝස්තු 05 දින ඉදිරිපත් කර තිබුණි. | ඉදිරියේදී මෙම ප්‍රමාදය වළක්වා නියමිත දිනට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට පියවර ගනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට පෙර ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වීම. |

### 4.2 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව ආයතනය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟාවිය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගෙන නොතිබුණි. | එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව ආයතනය විසින් හඳුනාගත් අරමුණු වෙනුවෙන් දායක වීමට කටයුතු කරනු ලැබේ. | තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා දර්ශක නිරීක්ෂණ කළ යුතු වීම. |